30231

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

| | | |
|---|---|---|
| සාමාන්‍ය පොදු පරීක්ෂණය<br>பொதுச் சாதாரணப் பரீட்சை<br>Common General Test | **12 S** | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**
- ※ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත් ව කියවන්න.
- ※ 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරා ගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

1. ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් එකක් 2023 ජූලි 01 දින සිය 80 වෙනි සංවත්සර උත්සවය පැවැත්විය. ලෝකයේ දෙවැනි විශාලතම කියවීම් ශාලාව මෙම විශ්වවිද්‍යාලයේ පුස්තකාලය සතු වේ. මෙම විශ්වවිද්‍යාලය කුමක් ද?
   (1) මොරටුව විශ්වවිද්‍යාලය (2) කොළඹ විශ්වවිද්‍යාලය
   (3) පේරාදෙණිය විශ්වවිද්‍යාලය (4) යාපනය විශ්වවිද්‍යාලය
   (5) කැලණිය විශ්වවිද්‍යාලය

2. 1972 මැයි 22 දින සිට ශ්‍රී ලංකාවේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් (මෙය ශ්‍රී ලංකා ජනරජ ව්‍යවස්ථාව ලෙස හැඳින්විණි) ක්‍රියාත්මක කරනු ලැබීමට සමගාමීව එවකට ශ්‍රී ලංකාවේ සිටි අග්‍රාණ්ඩුකාරවරයා ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනාධිපතිවරයා ලෙස පත් කරනු ලැබිය. මෙසේ ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනාධිපතිවරයා ලෙස පත්වීමේ ගෞරවය හිමිවූයේ කා හට ද?
   (1) ශ්‍රීමත් ඩී. බී. ජයතිලක (2) ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක
   (3) ශ්‍රීමත් ජෝන් කොතලාවල (4) විලියම් ගොපල්ලව මහතා
   (5) ජී. එෆ්. මොලමුරේ මහතා

3. ශ්‍රී ලංකාවේ යටත්විජිත යුගයේදී රටෙහි සමහර කොටස් යටත් කරගෙන සිටි ජාතිහු මෙරට ඇතැම් වටිනා සම්පත් පැහැරගෙන ගියහ. මෙසේ පැහැරගෙන ගිය රත්රන්, රිදී, පිත්තල සහ පද්මරාග ඔබ්බවනු ලැබුවාවූත් අවුරුදු 275 කටත් වඩා පැරණිවූත් කාලතුවක්කුවක් ඇතුළු යටත්විජිත යුගයට අයත් වටිනා වස්තු හයක නිල අයිතිය ශ්‍රී ලංකාවට යළි පවරාදීමේ ගිවිසුමක් මෑතකදී අත්සන් කරන ලද්දේ පහත සඳහන් කුමන රට විසින් ද?
   (1) ස්පාඤ්ඤය (2) ඉන්දියාව (3) නෙදර්ලන්තය
   (4) පෘතුගාලය (5) එක්සත් රාජධානිය

4. මෑත වර්ෂවලදී ළමාවිය ස්ථූලතාව තෙගුණ වී ඇති බව ශ්‍රී ලංකාවේ නව අධ්‍යයනවලින් වාර්තා වෙයි. කුඩා දරුවන් සහ නව යෞවනයන් අතර පවතින ස්ථූලතාවෙහි ප්‍රතිඵලයක් **නොවන්නේ** පහත සඳහන් කවරක් ද?
   (1) ඇදුම (2) අධි රුධිර පීඩනය (3) අධි කොලෙස්ටරෝල්
   (4) 2 වර්ගයේ දියවැඩියාව (5) පිළිකා

5. ශ්‍රී ලංකාව සාමාජිකයකු **නොවන්නේ** පහත සඳහන් කවර සංවිධානයක ද?
   (1) ආසියන් (ASEAN) (2) බිම්ස්ටෙක් (BIMSTEC)
   (3) එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNO) (4) සාර්ක් (SAARC)
   (5) පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් (Commonwealth countries)

6. 2023 අගෝස්තු 29 දින කරන ලද පරීක්ෂණ ශල්‍යකර්මයකදී කාන්තාවකගේ මොළයෙන් 8 cm ක් දිග සජීවී පරපෝෂිත පණුවකු ඉවතට ගන්නා ලද බව වාර්තා විය. මෙම ශල්‍යකර්මය මෙහෙය වූ ශල්‍ය වෛද්‍යවරුන් අතුරෙන් එක් අයකු වූයේ බෝවන රෝග විශේෂඥ වෛද්‍ය සංජය සේනානායකයි. මෙම ශල්‍යකර්මය සිදු කරන ලද්දේ කොහිදී ද?
   (1) ලන්ඩන් (2) කොළඹ (3) සිංගප්පූරුව
   (4) නව දිල්ලිය (5) කැන්බරා

[අදවැනි පිටුව බලන්න.

**17.** පෙරේරා මහතා *A* බැංකුවෙන් 18% ක වාර්ෂික සුළු පොළී අනුපාතිකයකට රු. 50 000 ක් ණයට ගත්තේ ය. ඒ සමගම ඔහු *B* බැංකුවෙන් රු. 75 000 ක් ද ණයට ගත්තේ ය. අවුරුද්දකට පසු ඔහු එක් එක් ණයෙහි පොළිය ලෙස එකම මුදලක් ගෙව්වේ ය. *B* බැංකුවෙහි වාර්ෂික සුළු පොළී අනුපාතිකය කොපමණ ද?

(1) 10% (2) 12% (3) 15% (4) 17% (5) 18%

**18.** කොස්තා මහතා සිය අන්තිම කැමති පත්‍රයෙන් පහත සඳහන් පරිදි දරුවන් තිදෙනා අතර සිය වත්කම් බෙදා දුන්නේ ය.

වැඩිමහලු පුතා : රු. මිලියන 17.5 ක් වටිනා ව්‍යාපාරික වත්කම්
දියණිය : රු. මිලියන 12.5 ක් වටිනා පොල් ඉඩම
බාල පුතා : රු. මිලියන 15 ක් වටිනා නිවස

මීට අමතරව කොස්තා මහතා ඔහුගේ බැංකු ගිණුමෙහි මුළු මුදල වන රු. මිලියන 50 න් 50% ක් වැඩිමහලු පුතා හා දියණිය අතර සමාන ප්‍රමාණවලින් ද ඉතිරි 50% බාල පුතාට ද වෙන් කළේ ය. කොස්තා මහතාගේ වත්කම් වැඩිමහලු පුතා, දියණිය සහ බාල පුතා වෙත පිළිවෙළින් කවර අනුපාතයට වෙන් කරනු ලැබුවේ ද?

(1) 2 : 3 : 4 (2) 3 : 2 : 5 (3) 3 : 4 : 6 (4) 5 : 6 : 7 (5) 6 : 5 : 8

**19.** එක්තරා පාසලක සිසුහු 900 දෙනෙක් සිටිති. ප්‍රාථමික අංශයෙහි, මධ්‍යම අංශයෙහි සහ ඉහළ අංශයෙහි සිසුන් සංඛ්‍යා අතර අනුපාතය 3 : 2 : 1ක් වේ. මධ්‍යම අංශයෙහි සිසුන්ගෙන් 20% ක් විෂයයක් වශයෙන් සංගීතය හදාරත් නම්, මධ්‍යම අංශයෙහි සංගීතය හදාරණ ශිෂ්‍ය සංඛ්‍යාව කිය ද?

(1) 45 (2) 50 (3) 55 (4) 60 (5) 65

**20.** පැත්තක දිග 100 cm ක් වන සමචතුරස්‍රයකින් දිග 80 cm සහ පළල 75 cm වන සෘජුකෝණාස්‍රයක් කපාගන්නා ලදී. මුල් සමචතුරස්‍රයේ වර්ගඵලයට සාපේක්ෂව සෘජුකෝණාස්‍රයේ වර්ගඵලයේ ප්‍රතිශතය කුමක් ද?

(1) 40% (2) 50% (3) 60% (4) 70% (5) 80%

**21.** පලතුරු යුෂක් සාදා ඇත්තේ සංශුද්ධ වැල් දොඩම් යුෂ සහ සංශුද්ධ අඹ යුෂ පරිමාව අනුව 2 : 3 අනුපාතයට මිශ්‍ර කිරීමෙනි. පලතුරු බීමක් සෑදීම සඳහා මෙම යුෂ මිශ්‍රණය ජලය සමග 1:3 අනුපාතයට තනුක කරනු ලැබේ. මෙම පලතුරු යුෂ බීමෙහි ලීටර 1 ක අඩංගු වැල් දොඩම් පරිමාව කොපමණ ද?

(1) 50 ml (2) 100 ml (3) 150 ml (4) 200 ml (5) 250 ml

**22.** අයිස්ක්‍රීම් නිෂ්පාදනාගාරයක, කෝන් එකක් තුළට ඒකාකාර ශීඝ්‍රතාවකින් අයිස්ක්‍රීම් වත්කරනු ලැබේ. කෝන් එකක වෘත්තාකාර මුවෙහි අරය එහි උසට සමාන වේ. තත්පර බාගයකදී කෝන් එකක උසෙන් හරි අඩක් අයිස්ක්‍රීම්වලින් පිරේ නම්, කෝන් එකෙහි මුළු උසටම අයිස්ක්‍රීම් පිරෙන්නට තව තත්පර කීයක් ගතවේ ද?

(1) 2.5 (2) 3.5 (3) 4.0 (4) 5.0 (5) 5.5

- අංක 23 සිට 26 තෙක් ප්‍රශ්න, ක්‍රැබිලෝනියාව සහ ග්‍රැබිලෝනියාව නමැති කල්පිත රාජධානි දෙකක් මත පදනම් වේ. අතක තිබෙන ඇඟිලි ගණන පහක් වීම පාදක කොට ගත් ග්‍රැබිලෝනියානුවන් ගණන් කිරීම සඳහා පහේ පාදය භාවිත කළ අතර, අද වන තුරු හෙළිකර ගත නොහැකි වූ කිසියම් හේතුවක් නිසා ක්‍රැබිලෝනියානුවන් භාවිත කර ඇත්තේ තුනේ පාදය යි. ග්‍රැබිලෝනියානුවන් දෙක තෙක් සංඛ්‍යා ලිවීමට ඒ සඳහා වූ ක්‍රැබිලෝනියානු සංකේතම භාවිත කළ අතර, ඊට ඉහළ සංඛ්‍යා ලිවීමට ඔවුහු තමන්ටම ආවේණික සංකේත භාවිත කළහ.


**23.** ග්‍රැබිලෝනියානු ක්‍රමයෙන් ලිවීමේදී තනි සංකේතයක් පමණක් නැවත නැවත යොදාගනිමින් නිරූපණය කළ **නොහැක්කේ** පහත දැක්වෙන කුමන සංඛ්‍යාව ද?

(1) 6 (2) 17 (3) 24 (4) 31 (5) 62

**24.** 42 හි ග්‍රැබිලෝනියානු නිරූපණයෙහි ක්‍රැබිලෝනියානු නොවන සංකේත කීයක් දක්නට ලැබේ ද?

(1) 0 (2) 1 (3) 2 (4) 3 (5) 4

**25.** ක්‍රැබිලෝනියානුවන් විසින් 45 ලියනු ලැබුවේ,  ලෙස නම්, එය ග්‍රැබිලෝනියානුවන් ලියූ ආකාරය පහත දැක්වෙන කුමක් විය හැකි ද?

(1)  (2)  (3) 

(4)  (5) 

**26.** පහත දැක්වෙන ප්‍රකාශ, ඒවායේ විශ්වසනීයතාව අනුව පෙළ ගස්වන්න.

$S_1$ : ක්‍රැබිලෝනියානු හෝ ග්‍රැබිලෝනියානු ත්‍රිකෝණ සඳහා පයිතගරස් සම්බන්ධය වලංගු නොවේ.
$S_2$ : බොහෝ ක්‍රැබිලෝනියානු දරුවෝ ග්‍රැබිලෝනියානු දරුවන්ට වඩා ඉක්මනින් සංඛ්‍යා උගනිති.
$S_3$ : ක්‍රැබිලෝනියානු දරුවෝ ඔවුන්ගේ ග්‍රැබිලෝනියානු සගයන්ට වඩා වැඩි කාලයක් ගුණකිරීම සඳහා ගත කරති.

(1) $S_1 < S_2 < S_3$ (2) $S_2 < S_1 < S_3$ (3) $S_3 < S_1 < S_2$
(4) $S_1 < S_3 < S_2$ (5) $S_2 < S_3 < S_1$

**17.** පෙරේරා මහතා *A* බැංකුවෙන් 18% ක වාර්ෂික සුළු පොළී අනුපාතිකයකට රු. 50 000 ක් ණයට ගත්තේ ය. ඒ සමගම ඔහු *B* බැංකුවෙන් රු. 75 000 ක් ද ණයට ගත්තේ ය. අවුරුද්දකට පසු ඔහු එක් එක් ණයෙහි පොළිය ලෙස එකම මුදලක් ගෙවී ය. *B* බැංකුවෙහි වාර්ෂික සුළු පොළී අනුපාතිකය කොපමණ ද?

(1) 10% (2) 12% (3) 15% (4) 17% (5) 18%

**18.** කොස්තා මහතා සිය අන්තිම කැමති පත්‍රයෙන් පහත සඳහන් පරිදි දරුවන් තිදෙනා අතර සිය වත්කම් බෙදා දුන්නේ ය.

වැඩිමහලු පුතා : රු. මිලියන 17.5 ක් වටිනා ව්‍යාපාරික වත්කම්
දියණිය : රු. මිලියන 12.5 ක් වටිනා පොල් ඉඩම
බාල පුතා : රු. මිලියන 15 ක් වටිනා නිවස

මීට අමතරව කොස්තා මහතා ඔහුගේ බැංකු ගිණුමෙහි මුළු මුදල වන රු. මිලියන 50 න් 50% ක් වැඩිමහලු පුතා හා දියණිය අතර සමාන ප්‍රමාණවලින් ද ඉතිරි 50% බාල පුතාට ද වෙන් කළේ ය. කොස්තා මහතාගේ වත්කම් වැඩිමහලු පුතා, දියණිය සහ බාල පුතා වෙත පිළිවෙළින් කවර අනුපාතයට වෙන් කරනු ලැබුවේ ද?

(1) 2 : 3 : 4 (2) 3 : 2 : 5 (3) 3 : 4 : 6 (4) 5 : 6 : 7 (5) 6 : 5 : 8

**19.** එක්තරා පාසලක සිසුහු 900 දෙනෙක් සිටිති. ප්‍රාථමික අංශයෙහි, මධ්‍යම අංශයෙහි සහ ඉහළ අංශයෙහි සිසුන් සංඛ්‍යා අතර අනුපාතය 3 : 2 : 1ක් වේ. මධ්‍යම අංශයෙහි සිසුන්ගෙන් 20% ක් විෂයයක් වශයෙන් සංගීතය හදාරත් නම්, මධ්‍යම අංශයෙහි සංගීතය හදාරණ ශිෂ්‍ය සංඛ්‍යාව කිය ද?

(1) 45 (2) 50 (3) 55 (4) 60 (5) 65

**20.** පැත්තක දිග 100 cm ක් වන සමචතුරස්‍රයකින් දිග 80 cm සහ පළල 75 cm වන සෘජුකෝණාස්‍රයක් කපාගන්නා ලදී. මුල් සමචතුරස්‍රයේ වර්ගඵලයට සාපේක්ෂව සෘජුකෝණාස්‍රයේ වර්ගඵලයේ ප්‍රතිශතය කුමක් ද?

(1) 40% (2) 50% (3) 60% (4) 70% (5) 80%

**21.** පලතුරු යුෂක් සාදා ඇත්තේ සංශුද්ධ වැල් දොඩම් යුෂ සහ සංශුද්ධ අඹ යුෂ පරිමාව අනුව 2 : 3 අනුපාතයට මිශ්‍ර කිරීමෙනි. පලතුරු බීමක් සෑදීම සඳහා මෙම යුෂ මිශ්‍රණය ජලය සමග 1:3 අනුපාතයට තනුක කරනු ලැබේ. මෙම පලතුරු යුෂ බීමෙහි ලීටර 1 ක අඩංගු වැල් දොඩම් පරිමාව කොපමණ ද?

(1) 50 ml (2) 100 ml (3) 150 ml (4) 200 ml (5) 250 ml

**22.** අයිස්ක්‍රීම් නිෂ්පාදනාගාරයක, කෝන් එකක් තුළට ඒකාකාර ශීඝ්‍රතාවකින් අයිස්ක්‍රීම් වත්කරනු ලැබේ. කෝන් එකක වෘත්තාකාර මුවෙහි අරය එහි උසට සමාන වේ. තත්පර බාගයකදී කෝන් එකක උසෙන් හරි අඩක් අයිස්ක්‍රීම්වලින් පිරේ නම්, කෝන් එකෙහි මුළු උසටම අයිස්ක්‍රීම් පිරෙන්නට තව තත්පර කීයක් ගතවේ ද?

(1) 2.5 (2) 3.5 (3) 4.0 (4) 5.0 (5) 5.5

- අංක 23 සිට 26 තෙක් ප්‍රශ්න, කැබිලෝනියාව සහ ගැබිලෝනියාව නමැති කල්පිත රාජධානි දෙකක් මත පදනම් වේ. අතක තිබෙන ඇඟිලි ගණන පහක් වීම පාදක කොට ගත් ගැබිලෝනියානුවන් ගණන් කිරීම සඳහා පහේ පාදය භාවිත කළ අතර, අද වන තුරු හෙළිකර ගත නොහැකි වූ කිසියම් හේතුවක් නිසා කැබිලෝනියානුවන් භාවිත කර ඇත්තේ තුනේ පාදය යි. ගැබිලෝනියානුවන් දෙක තෙක් සංඛ්‍යා ලිවීමට ඒ සඳහා වූ කැබිලෝනියානු සංකේතම භාවිත කළ අතර, ඊට ඉහළ සංඛ්‍යා ලිවීමට ඔවුහු තමන්ටම ආවේණික සංකේත භාවිත කළහ.



**23.** ගැබිලෝනියානු ක්‍රමයෙන් ලිවීමේදී තනි සංකේතයක් පමණක් නැවත නැවත යොදාගනිමින් නිරූපණය කළ නොහැක්කේ පහත දැක්වෙන කුමන සංඛ්‍යාව ද?

(1) 6 (2) 17 (3) 24 (4) 31 (5) 62

**24.** 42 හි ගැබිලෝනියානු නිරූපණයෙහි කැබිලෝනියානු නොවන සංකේත කීයක් දක්නට ලැබේ ද?

(1) 0 (2) 1 (3) 2 (4) 3 (5) 4

**25.** කැබිලෝනියානුවන් විසින් 45 ලියනු ලැබුවේ,  ලෙස නම්, එය ගැබිලෝනියානුවන් ලියූ ආකාරය පහත දැක්වෙන කුමක් විය හැකි ද?

(1)  (2)  (3) 

(4)  (5) 

**26.** පහත දැක්වෙන ප්‍රකාශ, ඒවායේ විශ්වසනීයතාව අනුව පෙළ ගස්වන්න.


$S_1$ : කැබිලෝනියානු හෝ ගැබිලෝනියානු ත්‍රිකෝණ සඳහා පයිතගරස් සම්බන්ධය වලංගු නොවේ.
$S_2$ : බොහෝ කැබිලෝනියානු දරුවෝ ගැබිලෝනියානු දරුවන්ට වඩා ඉක්මනින් සංඛ්‍යා උගනිති.
$S_3$ : කැබිලෝනියානු දරුවෝ ඔවුන්ගේ ගැබිලෝනියානු සගයන්ට වඩා වැඩි කාලයක් ගුණකිරීම සඳහා ගත කරති.


(1) $S_1 < S_2 < S_3$ (2) $S_2 < S_1 < S_3$ (3) $S_3 < S_1 < S_2$


(4) $S_1 < S_3 < S_2$ (5) $S_2 < S_3 < S_1$


**27.** බිත්ති ඔරලෝසුවක මුහුණතෙහි තල දර්පණයක් මත ප්‍රතිබිම්බය රූපයෙන් දැක්වේ.


බිත්ති ඔරලෝසු මුහුණතෙහින් තල දර්පණයෙහින් නිවැරදි පිහිටීම දක්වන්නේ පහත දී ඇති කවර රූපය ද?





(1)



(2)



(3)



(4)



(5)


**28.** රූපයෙහි දී ඇති පතරොම භාවිත කර, ඝනකයක් සෑදුවහොත්, එම ඝනකයෙහි නිවැරදි පෙනුමක් නිරූපණය **නොකරන්නේ** පහත දී ඇති කවර රූපය ද?





(1)


(2)


(3)


(4)


(5)

**29.** ද්විමාන ලෝකයක වසන පිටසක්වලයකු සතුව පවතින්ට **අපහසුම** වන්නේ පහත සඳහන් කවරක් ද?

(1) ආහාර ජීර්ණ පද්ධතියක් (2) ශ්වසන පද්ධතියක්
(3) රුධිර සංසරණ පද්ධතියක් (4) ස්නායු පද්ධතියක්
(5) සැකිලි පද්ධතියක්

**30.** දී ඇති ප්‍රකාශ, නිශ්චිතවම සිදුවන (A), සිදුවීමට හැකි (B), සිදුවීමේ ඉඩ බෙහෙවින් අඩු (C) සහ කිසිසේත් සිදු නොවන (D) ලෙස වර්ග කරන්න.

1. එකම දිස්ත්‍රික්කයෙන් පැමිණි මන්ත්‍රීවරු දෙදෙනෙක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සිටිති.
2. යුරෝපා සංගමයෙන් බ්‍රිතාන්‍යය ඉවත්වීමේ ක්‍රියාවලියේදී (BREXIT) තම පක්ෂය ගත් ස්ථාවරය සම්බන්ධයෙන් ඇතැම් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීවරු අප්‍රසාදයෙන් පසුවෙති.
3. ඇතැම් මයික්‍රොනීසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු උදේ ආහාරය සඳහා සම්බෝල සහ පොල් රොටී අනුභව කරති.
4. කිසිදු මැලේසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනකු සතියේ එකම දවසේ ඉපදී නැත.

(1) A, B, C, D (2) B, C, A, D (3) B, D, A, C (4) C, B, A, D (5) D, C, B, A

**31.** දත්ත ඇසුරෙන් නිගමනයට එළඹිය **නොහැක්කේ** පහත සඳහන් කවර යුගලයෙහි ද?

| | **දත්ත** | **නිගමනය** |
|---|---|---|
| (1) | සියලුම මහචාර්යවරු වයිට්බෝඩ්වලට වඩා කළු ලෑලිවලට කැමතිවෙති. | මහාචාර්ය ජේනාරත්න වයිට්බෝඩ්වලට වඩා කළු ලෑලිවලට කැමති ය. |
| (2) | කිසියම් සරල රේඛා දෙකක් ඡේදනය වන්නේ එකම එක ලක්ෂයක දී ය. | ඒවා සමාන්තර නොවේ. |
| (3) | ජිම්ගේ වලිගය, රෙක්සිගේ වලිගයට වඩා කෙටි ය. | ජිම්ගේ වලිගයේ දිගෙහි වර්ගමූලය, රෙක්සිගේ වලිගයේ දිගෙහි වර්ගමූලයට වඩා කුඩා වේ. |
| (4) | සෘජුකෝණී ත්‍රිකෝණයක පාද දෙකක දිග ඒකක 3 සහ 4 වේ. | අනෙක් පාදයෙහි දිග ඒකක 5 කි. |
| (5) | ත්‍රිකෝණයේ ශීර්ෂ තුන සමචතුරස්‍රයේ එකිනෙකට වෙනස් පාද මත පිහිටන පරිදි සමචතුරස්‍රයක් තුළ ත්‍රිකෝණයක් අන්තර්ගත කර ඇත. | සමචතුරස්‍රයෙහි පාදයක දිගට නොඅඩු දිගකින් යුත් පාදයක් ත්‍රිකෝණයට ඇත. |

● අංක 32 සිට 35 තෙක් ප්‍රශ්න, මිතුරන් පස්දෙනෙකු, ඔවුන් පමණක් සහභාගි වූ ධාවන තරගයක අතීත මතකය සිහිපත් කිරීමට ප්‍රයත්න දරන, පහත දැක්වෙන සංවාදය මත පදනම් වේ.

අඹගමුව : මතක ද යාළුවනේ, මම ඔය රේස් එකෙන් පළවෙනි තැන දිනාගත්තු හැටි?

දඹගමුව : පිස්සු ද? ඔයා තුන්වෙනියා! මමයි පළවැනි තැන දිනාගත්තේ.

නාරංගමුව : යාළුවා, මම හිතන්නේ ඔයාට වැරදිලා. මට මතක හැටියට අපේ යාළුවා කෙසෙල්ගමුව තමයි පළමුවැනියා වුනේ.

කෙසෙල්ගමුව : නෑ යාළුවා, ඔහොම නොවෙයි වුනේ. කියන්නත් දුකයි, මම තමයි අන්තිමයා - මොකද එදා මට තද හිසේ කැක්කුමක් තිබුණා. මට මතකයි නාරංගමුව ඔයා තමයි මට ඉස්සරහින් තරගය ඉවර කළේ.

දෙල්ගමුව : මෙහෙමයි, මමයි තුන්වෙනියා වුනේ. මට මතක එච්චරයි.

32. තුන්වෙනියා වූයේ කෙසෙල්ගමුව නම්, සත්‍ය ප්‍රකාශය කරන්නා කවුරුන් විය හැකි ද?
(1) අඹගමුව (2) දඹගමුව (3) නාරංගමුව
(4) කෙසෙල්ගමුව (5) දෙල්ගමුව

33. සත්‍ය ප්‍රකාශ කරන්නන්ගේ සංඛ්‍යාව එයට ගත හැකි ඉහළම අගය ගන්නා විට, දෙවන ස්ථානය දිනා තිබිය යුත්තේ කවුරුන් විසින් ද?
(1) අඹගමුව (2) දඹගමුව (3) නාරංගමුව
(4) කෙසෙල්ගමුව (5) දෙල්ගමුව

34. පුද්ගලයන් දෙදෙනකු සත්‍ය ප්‍රකාශ කරත් නම් සහ අඹගමුව අන්තිමයා වූයේ නම්, ප්‍රථම ස්ථානය දිනා ගනු ලැබුවේ කවුරුන් විසින් ද?
(1) දඹගමුව (2) නාරංගමුව (3) කෙසෙල්ගමුව
(4) දෙල්ගමුව (5) නිර්ණය කිරීමට දී ඇති තොරතුරු ප්‍රමාණවත් නොවේ.

35. පුද්ගලයන් දෙදෙනකු සත්‍ය ප්‍රකාශ කරත් නම්, සහ අඹගමුවට ඉදිරියෙන් දිනුම් රේඛාවට ළඟා වූ පුද්ගලයා නාරංගමුව නම්, දෙවන ස්ථානය දිනා ගත්තේ කවුරුන් ද?
(1) අඹගමුව (2) දඹගමුව (3) නාරංගමුව
(4) කෙසෙල්ගමුව (5) දෙල්ගමුව

● අංක 36 සිට 38 තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

සමාගමක් ඔවුන්ගේ සේවකයින් අතුරෙන් හොඳම කාර්ය සාධනයක් ඇති පස්දෙනා ලකුණු දීමේ පටිපාටියකට අනුව තෝරා ගෙන ඇත. අංක 01 සිට 05 තෙක් ස්ථාන දිනා ඇත්තේ *A*, *B*, *C*, *D* සහ *E*, යන පස්දෙනා විසින් වන නමුත් එම නම් සඳහන් කර ඇත්තේ ඔවුන්ගේ ස්ථානවල අනුපිළිවෙළින් නොවේ. එම සෑම අයකුටම තමා සංචාරය කිරීමට කැමති රටක් නම් කරන ලෙස දන්වා ඇති අතර, ඒ සඳහා වියදම් සමාගම විසින් දරනු ලැබේ. ඔවුන් නම් කළ රටවල් ඕස්ට්‍රේලියාව, ප්‍රංශය, ජපානය, එක්සත් රාජධානිය (UK) සහ අමෙරිකා එක්සත් ජනපදය (USA) වේ. රටවල නම් සඳහන් කර ඇත්තේ ද සේවකයින්ගේ නම්වල අනුපිළිවෙළ හෝ ඔවුන්ගේ ස්ථානවල අනුපිළිවෙළ හෝ අනුව නොවේ. පහත දැක්වෙන විස්තර ද සපයා ඇත.

* *D* ට වඩා ලකුණු ලබා ඇත්තේ *B* පමණි.
* *C* ලබා ඇති ලකුණු ඕස්ට්‍රේලියාවේ සංචාරය කිරීමට කැමති සේවකයාට වඩා වැඩියෙනුත් ජපානයේ සංචාරය කිරීමට කැමති සේවකයාට වඩා අඩුවෙනුත් වේ.
* පළමුවන ස්ථානය දිනාගත් සේවකයා UK හි සංචාරය කිරීමටත් තුන්වැනි ස්ථානය දිනාගත් සේවකයා ජපානයෙහි සංචාරය කිරීමටත් කැමති ය.
* *C* සංචාරය කිරීමට කැමති රට USA **නොවේ**.
* *E* සංචාරය කිරීමට කැමති රට ඕස්ට්‍රේලියාව **නොවේ**.

36. සේවකයන් පස්දෙනා අතුරෙන් ප්‍රථම ස්ථානය දිනාගෙන ඇත්තේ කවුරුන් ද?
(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

37. සේවකයන් පස්දෙනා අතුරෙන් පස්වෙනි ස්ථානය දිනාගෙන ඇත්තේ කවුරුන් ද?
(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

38. *D* සේවකයා සංචාරය කිරීමට කැමති රට කුමක් ද?
(1) ඕස්ට්‍රේලියාව (2) ප්‍රංශය (3) ජපානය (4) UK (5) USA

අංක 39 සහ 40 ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශය දුර්වල කරන ප්‍රබලතම සාක්ෂ්‍යය (එය සත්‍ය වේ නම්) කුමක් ද?

39. ප්‍රකාශය : සෑම වසරකදී ම අලුතින් ප්‍රකාශයට පත්වන පොත් එයට ලැබේ නම්, ප්‍රදේශයේ වැඩිහිටි සාක්ෂරතාව වර්ධනය කිරීමට සමත් මහජන පුස්තකාලයක් සෑම ප්‍රදේශයකම පිහිටා තිබේ.
   (1) මුල්ලේගම සියලුම මහජන පුස්තකාලවලට සෑම මාස හයකට වරක් ම අලුත් පොත් ලැබෙන නමුත් පසුගිය වසර හත පුරා ප්‍රදේශයේ වැඩිහිටි සාක්ෂරතාව 6% කින් පහත බැස ඇත.
   (2) පසුගිය වසර පහේදී අලුත් පොත් කිසිවක් ප්‍රාදේශීය මහජන පුස්තකාලයට ලැබී නොමැති නමුත් බත්තලංගුණ්ඩුවෙහි වැඩිහිටි සාක්ෂරතාව පසුගිය වසරේදී 10% කින් වැඩි වී ඇත.
   (3) මඩොල්දූවෙහි එක් මහජන පුස්තකාලයකට සෑම වසරකම අලුත් පොත් ලැබෙන නමුත් පසුගිය වසර 10 ක දී වැඩිහිටි සාක්ෂරතාව 5% කින් පහත බැස ඇත.
   (4) වයඹ පළාතෙහි අලුත් මහජන පුස්තකාල කිහිපයක් විවෘත කරන ලද අතර, පසුගිය වර්ෂයේදී වැඩිහිටි සාක්ෂරතාව 6%කින් වැඩි වී ඇත.
   (5) රටෙහි සියලුම ප්‍රදේශවල අවු තරමින් එක් මහජන පුස්තකාලයක්වත් තිබෙන නමුත් රටේ වැඩිහිටි සාක්ෂරතාව අඩුවෙමින් පවතී.

40. ප්‍රකාශය : උතුරු මැද පළාතෙහි සෑම දිස්ත්‍රික්කයකටම අධික වැසි ලැබෙන මාසයක් ඇති අතර, එම මාසයේදී පළාතේ එළවලු නිෂ්පාදනය ද ඉහළ ය.
   (1) මේ වර්ෂය පුරාම පොළොන්නරුවෙහි වැසි නොමැති නමුත් එහි එළවලු නිෂ්පාදනය පසුගිය වර්ෂයට වඩා බොහෝ යහපත් විය.
   (2) මැයි මාසයේදී අනුරාධපුරයට හෝ පොළොන්නරුවට හෝ අධික වර්ෂාවක් නොලැබුණු නමුත් සැප්තැම්බර් මාසයේදී එළවලු නිෂ්පාදනය වැඩිතම විය.
   (3) මුළු වර්ෂය පුරාම අනුරාධපුරයට අඩු වර්ෂාපතනයක් ලැබුණු අතර එහි එළවලු නිෂ්පාදනයද පසුගිය වර්ෂයට වඩා යහපත් විය.
   (4) ජනවාරි, සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවලදී පොළොන්නරුවෙහි ගංවතුර පැවති අතර එය දිස්ත්‍රික්කයෙහි එළවලු නිෂ්පාදනයට අහිතකර ලෙස බලපෑවේ ය.
   (5) යල කන්නයේදී වැසි මදවීම හේතුවෙන් අනුරාධපුරයේත් පොළොන්නරුවේත් ඇතැම් කුඹුරු ඉඩම් නීතියට පටහැනි ලෙස එළවලු කොරටු බවට පත්කරනු ලැබිණි.

● අංක 41 සහ 42 ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

සමාගමක රැකියා සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් පස්දෙනකු පිළිබඳ තොරතුරුවල සාරාංශයක් වගුවෙහි දැක්වේ. සෑම අයදුම්කරුවකුගේම ඉහළම අධ්‍යාපන සුදුසුකම අ.පො.ස. උසස් පෙළ වේ. ඔවුන්ගේ ප්‍රතිඵල සහ වයස, බඳවාගැනීම් සඳහා සලකා බැලේ.

| අයදුම්කරුගේ නම | උපන්දිනය | අ.පො.ස. උසස් පෙළ විභාගයේ ප්‍රධාන විෂයවල ශ්‍රේණි | | | සාමාන්‍ය ඉංග්‍රීසි ශ්‍රේණිය | සාමාන්‍ය පොදු පරීක්ෂණය (CGT) සඳහා ලකුණු |
|---|---|---|---|---|---|---|
| | | විෂයය 1 | විෂයය 2 | විෂයය 3 | | |
| *P* | 2002.01.01 | A | A | B | B | 68 |
| *Q* | 2001.01.01 | B | C | A | A | 72 |
| *R* | 2001.10.01 | B | C | C | A | 80 |
| *S* | 2000.08.20 | A | B | A | B | 70 |
| *T* | 2002.05.31 | B | A | A | B | 70 |

අ.පො.ස. උසස් පෙළ විෂයයන් සඳහා ලකුණුදීමේ පටිපාටිය පහත පරිදි වේ.

ප්‍රධාන විෂයයන් තුන සහ සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය සඳහා A ශ්‍රේණිය = ලකුණු 80, B ශ්‍රේණිය = ලකුණු 70, C ශ්‍රේණිය = ලකුණු 60, S ශ්‍රේණිය = ලකුණු 50.

එක් එක් අයදුම්කරුගේ අවසාන ලකුණ, විෂයයන් හතරෙහි ශ්‍රේණිවලට වෙන්කරන ලද ලකුණුවල එකතුවට CGT ලකුණු එකතුකිරීමෙන් ගණනය කරනු ලැබේ.


41. 2023 ජූලි 01 දිනට වයස අවුරුදු 22 ට අඩු අයදුම්කරුවන් අතුරෙන් ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවා කවුරුන් ද?
   (1) *P* (2) *Q* (3) *R* (4) *S* (5) *T*

42. "කණ්ඩායමක සාමාජිකයකුගේ තරාව" යනුවෙන් අදහස් කෙරෙනුයේ කණ්ඩායමේ සියලුම සාමාජිකයන්, එක් එක් සාමාජිකයාගේ මුළු ලකුණුවල අවරෝහණ පටිපාටිය අනුව පිහිටවනු ලබන අනුපිළිවෙළෙහි ඔහුට/ඇයට හිමිවන ස්ථානයයි. ඒ අනුව *P* ගේ තරාව කුමක් ද?
   (1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

● අංක **43** සහ **44** ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

රූප සටහනෙහි, *ABCD*, *BEFG*, *EHIJ* සහ *HAKL* සෘජුකෝණාස්‍ර, එක්තරා පාසලක උසස් පෙළ පන්තිවල පිළිවෙළින් භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් ඉගෙනගන්නා ශිෂ්‍ය සංඛ්‍යා ඉදිරිපත් කරයි. ඉහත සඳහන් විෂය හතරෙන් එනෑම දෙකක් ඉගෙනගන්නා සෑම ශිෂ්‍යයෙක්ම රසායන විද්‍යාව ද ඉගෙන ගනියි.

මෙම පාසලෙහි භෞතීය විද්‍යා විෂය ධාරාවෙහි සිටින සියලුම ශිෂ්‍යයෝ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂය තුන උගනිති.




**43.** මෙම පාසලේ භෞතීය විද්‍යා විෂය ධාරාවෙහි ශිෂ්‍යයෝ කීදෙනෙක් සිටිත් ද?
(1) 10 (2) 100 (3) 120 (4) 200 (5) 220

**44.** මෙම පාසලේ අවම තරමින් ශිෂ්‍යයෝ කී දෙනෙක් රසායන විද්‍යාව විෂයය උගනිත් ද?
(1) 250 (2) 260 (3) 270 (4) 280 (5) 290

**45.** මෙම ප්‍රශ්නයෙහි, 1 සහ 7 මගින් අංකනය කර ඇති වාක්‍ය දෙක අතර ඇති *A, B, C, D, E* වාක්‍ය ඒවායේ නියමිත පටිපාටියෙහි **නොමැත**. වාක්‍ය හතෙහි තාර්කික අනුක්‍රමයක් සැකසීම සඳහා ඒවායේ නිවැරදි පිළියෙල කිරීම තෝරන්න.

1 – ශ්‍රී ලංකාවේ පොල් රෝපණය සෑම වර්ෂයකම සැප්තැම්බර්/ඔක්තෝබර් සිට දෙසැම්බර් තෙක් මහ කන්නයේ වර්ෂාපතනය ආරම්භ වීමත් සමග සිදුකරනු ලැබේ.

*A* – පොල් තවාන්වල බීජ ප්‍රරෝහණය වන කාලය තුළ, සෑම වර්ෂයකදීම වැසි සමයට පෙරාතුව කල් ඇතිවම පොල් වගාව සඳහා බිම් සකස් කිරීමේ ක්‍රියාකාරකම් ආරම්භ කෙරේ.

*B* – එක් ඇසක් (සිදුරක්) හරහා බීජ පැළ අංකුර ඇදීම ඇරඹී, ඉනික්බිති පොල් ලෙල්ලෙන් පිටතට අංකුර පැමිණෙනු දක්නට ලැබේ.

*C* – අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී නිරෝගී බීජවල පර්ණාංග (පත්‍ර) 5ක් 6ක් හටගැනෙන අතර, ඒවා නැවත සිටුවීම සඳහා සුදුසු වේ.

*D* – බීජ ගෙඩි තවාන්වල අතුරා, නියමිත කාල ප්‍රාන්තරවලදී ජල සැපයීම කෙරේ.

*E* – ජනවාරි, පෙබරවාරි, මාර්තු මාසවලදී හඳුනාගත් මව්ශාකවලින් බීජ ගෙඩි ලබාගෙන, තවාන්වලට ප්‍රවාහනය කරනු ලැබේ.

7 – වගාකරුවන්ට අගෝස්තු සිට දෙසැම්බර් තෙක් කාලය තුළදී නැවත සිටුවීම සඳහා ඇසුරුම් නොකළ හෝ පොලිතීන්වල අසුරන ලද හෝ බීජ, පොල් පැළ තවාන්වලින් මිල දී ගත හැකි ය.

(1) *A D E B C* (2) *A D E C B* (3) *A E D B C* (4) *B C D E A* (5) *D B C A E*

**46.** පහත දැක්වෙන සෑම *A, B, C, D* සහ *E* ඡේදයක්ම ප්‍රකාශ තුනකින් සමන්විත වේ. අර්ථාන්විත අනුක්‍රමයක පෙළගැස්විය හැක්කේ ඒවායින් කුමන ඡේදයේ අඩංගු වාක්‍ය තුන ද?

*A* (*a*) ලිපිය, ලියාපදිංචි තැපෑලෙන් යැවීම සඳහා රාජු තැපැල් කාර්යාලයට ගියේ ය.
(*b*) රාජු, ඔහුගේ නැති වූ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහතිකයෙහි සහතික කළ පිටපතක් ලබාගැනීම සඳහා විභාග දෙපාර්තමේන්තුවට ලිපියක් ලිවුවේ ය.
(*c*) ලියාපදිංචි තැපැල සඳහා මුද්දර ගාස්තුව රු. 110.00 කි.

*B* (*a*) ශ්‍රී ලංකාවේ උස්බිම්වල මිරිස් සහ ලූනු වගා කෙරේ.
(*b*) පිසින ලද ආහාර පරිරක්ෂණය කිරීමේ ක්‍රමයක් ලෙස වැඩිපුර කුළුබඩු එක් කෙරේ.
(*c*) වන්නියෙහි වාසය කරන අනුෂිකාට, ඇගේ දිවා හා රාත්‍රී ආහාර සමග මිරිස්, ලූනු සහ සුදුලූනු වැනි කුළුබඩු ආහාරයට ගැනීමේ පුරුද්දක් ඇත.

*C* (*a*) අඹ ගස පරීක්ෂා කළ කප්පාදු කරන්නා, එය මෙම වාරය සඳහා මල් හටගැනීම යාන්තමින් ආරම්භ කර ඇති බවත්, මල් හා ඵල හටගැනීම සම්පූර්ණ වන තෙක් කල්බලා සිටිය යුතු බවත් කීවේ ය.
(*b*) රොෂාන්, ගස් කප්පාදු කරන්නකු හමුවිය.
(*c*) අඹ ගසෙහි ඵලදාව වැඩිවන පරිදි ගසේ උඩුවියන තුළට ඇතුළුවන සූර්යාලෝකය වැඩි කිරීම සඳහා තම අඹ ගස කප්පාදු කිරීමට රොෂාන්ට අවශ්‍ය විය.

*D* (*a*) ලංකා විදුලිබල මණ්ඩලයෙහි මනු කියවන්නා මාසයෙහි වෙන් කරන ලද දිනයක සෑම නිවසකටම පැමිණෙයි.
(*b*) මනු කියවන්නා ඔහු පැමිණි දිනයත් එදිනට මනු පාඨාංකයත් විදුලි ගිණුම් ප්‍රකාශයෙහි (SEA) සටහන් කරයි.
(*c*) විදුලි ගිණුම් ප්‍රකාශයෙහි, පූර්ව මාසයෙහි මනු කියූ දිනයත්, එදින මනු පාඨාංකයත් මේ මාසය සඳහා අයකිරීම රුපියල්වලිනුත් ඇතුළත් වේ.


*E* (*a*) ශ්‍රී ලංකා රජය 2023 සැප්තැම්බර් මාසයේදී උතුරු පළාතෙහි නව පොල් ත්‍රිකෝණ ව්‍යාපෘතියක් ආරම්භ කළේ ය.
(*b*) අවුරුදු 50 කට පමණ පෙර ප්‍රථම පොල් ත්‍රිකෝණ ව්‍යාපෘතිය ස්ථාපිත කරන ලද්දේ පුත්තලම, කුරුණෑගල සහ කොළඹ ප්‍රදේශ ඇතුළත් වන පරිදි ය.
(*c*) පොල් ත්‍රිකෝණ ව්‍යාපෘති, පොල් වගාව පමණක් නොව පොල් ආශ්‍රිත කර්මාන්ත ද ප්‍රවර්ධනය කරයි.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*


**47.** පහත දැක්වෙන රූප මගින් විස්තර කෙරෙන සිද්ධිය සලකා බලන්න.




A




B




C



D



E



F

එම සිද්ධියේ නිවැරදි අනුක්‍රමය දෙනු ලබන්නේ රූපවල පහත දැක්වෙන කවර පෙළගැන්වීම මගින් ද?

(1) *D, A, C, E, B, F* (2) *A, C, D, E, B, F* (3) *A, D, F, B, E, F*
(4) *A, D, C, E, B, F* (5) *D, C, E, A, B, F*

- අංක **48** සිට **50** තෙක් ප්‍රශ්න, රාජා, ඔහුගේ භාර්යාව මාලා, උපන්දිනය සමරනු ලබන ශ්‍යාමා ඇතුළු දරුවන් හා උපන්දින උත්සවයේ ආරාධිතයන් අතර සිදුවන සංවාදයක් මත පදනම් වේ.

ඔවුන් උපන්දින උත්සවයට ආරාධනා කර ඇත්තේ ජෝන් මාමා (මාලාගේ සහෝදරයෙකි) සහ ඔහුගේ පවුලේ අයට පමණි. රාජා, මාලා, ජෝන් මාමා සහ පැමිණ සිටි ළමයින් අතර උත්සවයට පෙර සහ උත්සවයේදී ඇතිවන සංවාදයක් *A* සිට *L* තෙක් කොටස්වලින් සමන්විත වන නමුත් ඒවා සංවාදය සිද්ධ වූ අනුපිළිවෙල අනුව ඉදිරිපත් කර නොමැත.

*A.* සුබ සැන්දෑවක් ශ්‍යාමා, පුංචි පුතා ඇතුළු අනෙක් සියලු දෙනාටමත්.
*B.* සුබ සැන්දෑවක් ජෝන් මාමා, නැන්දා සහ හැමදෙනාටම.
*C.* ඔබට ඉතා ප්‍රීතිමත් උපන්දිනයක් ශ්‍යාමා (සියලුදෙනා ශ්‍යාමාට සුබ උපන්දිනයක් පතති.)
*D.* ඔව්, මම දන්නවා මාලා, අපි අපේ පොඩි එක්කෙනාගේ 9 වැනි උපන්දින උත්සවය පැවැත්වූයේ මාස තුනකට ඉස්සෙල්ලානේ. ඒ නිසා අපි මේ උත්සවය හවස කේක් එකක්, පේස්ට්‍රි ටිකක් එක්කල, යාළුවෝ සහ නෑදෑයෝ ටිකදෙනෙක් එකතු කරගෙන පවත්වමු.
*E.* රාජා, අපේ ශ්‍යාමාගේ 12 වැනි උපන්දිනය යෙදෙන්නේ දෙසැම්බර් 16 සෙනසුරාදා.
*F.* නැහැ මාමේ, තාත්තා මේ රටඉඳි කේක් එක ගෙනාවේ කොළඹ නමගිය බේකරියකින්.
*G.* හොඳ කේක් එකක්, නියම රස, සුවඳ. ඔයා මේක හදන්න විශේෂ ඇණවුමක් දුන්නා ද?
*H.* ඔයාට ස්තුතියි.
*I.* ගොඩාක් ස්තුතියි ජෝන් මාමාට, නැන්දාට සහ හැමදෙනාටම. සුබ රාත්‍රියක්.
*J.* ශ්‍යාමා අපේ සැලැස්ම එක්ක එකඟයි. ඒත් යාළුවෝ කීපදෙනකුට ආරාධනා කරන්න ඕනෑ.
*K.* මාත් මාලා එක්ක එකඟයි. ඔයා ඒක කරුණාකරලා ශ්‍යාමාට කියන්න.
*L.* අපි මේ සැරේ ගන්න ඕනෑ හොඳම තත්ත්වයේ බෙයා බ්‍රෑන්ඩ් රට ඉඳි කේක්. ජෝන් මාමාගේ පවුලේ අයට ආරාධනා කරන්නත් ඕනෑ.

**48.** රාජා සහ ඔහුගේ භාර්යාව අතර සංවාදය දෙනු ලබන්නේ පහත දැක්වෙන කවර වරණය මගින් ද?

(1) *E, D, J, L, K* (2) *E, D, K, J, L* (3) *E, D, L, K, J*
(4) *K, J, E, D, L* (5) *L, K, E, D, J*

**49.** ජෝන් මාමා සහ ශ්‍යාමා අතර සංවාදය දෙනු ලබන්නේ පහත දැක්වෙන කවර වරණය මගින් ද?

(1) *A, B, G, F, H* (2) *A, B, H, G, F* (3) *B, A, G, F, H*
(4) *G, F, A, B, H* (5) *G, F, H, A, B*

**50.** මුළු සංවාදයෙහි සැබෑ අනුපිළිවෙළ දෙනු ලබන්නේ පහත දැක්වෙන කවර වරණය මගින් ද?

(1) *E, D, J, K, L, C, G, F, H, A, B* (2) *E, D, J, L, K, C, A, B, H, F, G*
(3) *E, D, J, L, K, C, G, F, A, B, H* (4) *E, D, L, K, J, A, C, B, G, F, H*
(5) *K, J, E, D, L, C, G, F, A, B, H*

* * *